# නව වසරේ ශ්‍රීලාංකික දෙදෙනෙකුට මහ රැජිණගෙන් OBE ගෞරව නාම

**ඒ බර්මිංහැම් මහා විහාරාධිපති ආචාර්ය විතාරන්දෙනියේ කස්සප හිමියන් සහ ලන්ඩනයේ කිංස් කොලේජ් වෛද්‍ය පීඨයේ මහාචාර්ය සමන් වර්ණකුලසූරිය මහතා ය.**

Two distinguished Sri Lankans living in the UK have been awarded OBE ( Order of the British Empire) in the Queen's New Year Honours List for the services they render to the humanity. Ven.Dr Witharandeniye Kassapa Thero - the head of Birmingham Maha Viharaya, and Mr Saman Warnakulasuriya, Professor of Oral Medicine & Experimental Pathology, King's College London.




**ආචාර්ය පූජ්‍ය විතාරන්දෙනියේ කස්සප ස්වාමීන් වහන්සේ (OBE)**
**The President of International Buddhist Relief Organisation (IBRO)**

**වි**ශිෂ්ට රුහුණු පුත්‍රයෙකු වන කස්සප ස්වාමීන් වහන්සේගෙන් සිදුවන සමාජ සහ ශාසනික සේවය ඉමහත් ය. උන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් එක්සත් රාජධානියේ සිට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර බෞද්ධ සහන සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අනුබද්ධිත ය. එහි ශාඛා සිංගප්පූරුව, මැලේසියාව, ටැන්සානියාව, ඉතාලිය, ජර්මණිය, ස්විට්සර්ලන්තය, ශ්‍රීලංකාව, බ්‍රසීලය, ප්‍රංශය, ඉන්දියාව, සැම්බියාව ඇතුළු රටවල් ගණනාවක පිහිටුවා ඇත.

2003 වසරේ කස්සප ස්වාමීන් වහන්සේගෙන් වූ සේවය අගයමින් ශ්‍රීලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලය උන්වහන්සේට සම්මාන ආචාර්ය පදවියක් පිරිනැමුවා ය. ජාත්‍යන්තර සහන සේවා සංවිධානය ශ්‍රීලංකාවේ දිළිඳු ජනතාවට කරන සේවයන් අතර වයෝවෘද්ධ පිරිස් සඳහා විශාල සංඛ්‍යාවක් රෝද පුටු හා ඇස් කණ්ණාඩි පරිත්‍යාගකර ඇත. තවද එම සංවිධානය පාසැල් දරුවන් 500 කට අධ්‍යාපන වියදම් දරයි. වැලිගම සුනාමියෙන් අනාථ වූවන් වෙනුවෙන් ව්‍යාපෘති රැසක් අරඹා ඇත.

කස්සප හාමුදුරුවෝ ඕබීඊ ගෞරව නාමය මෙතෙක් ලබා ඇති දෙවෙනි භික්ෂූන් වහන්සේ වෙති. පළමුවැන්නා අපවත් වූ වජිරඤ්ඤාණ හිමියන්ය. තවත් දුර පරාර්ථ සේවය සඳහා කස්සප හිමියන්ට දීර්ඝායු ප්‍රාර්ථනා කරමු.



**මහාචාර්ය සමන් වර්ණකුලසූරිය**
**OBE, BDS (Cey) FDSRCS (Eng & Edin) PhD (Glasg) DSc. Professor of Oral Medicine & Experimental Pathology, King's College London**

**දො**ඩන්දූවේ උපත ලැබූ, ගාල්ල මහින්ද විදුහලේ දීප්තිමත් ආදි ශිෂ්‍යයෙකු වන මහාචාර්ය සමන් වර්ණකුලසූරිය මහතා ලන්ඩන් කිංස් කොලේජ් හි Oral Medicine & Experimental Pathology, (මුඛ වෛද්‍ය විද්‍යා අංශයේ ) මහාචාර්යවරයා වෙයි. එයට පෙරාතුව ඒ මහතා ලන්ඩනයේ ශල්‍ය වෛද්‍යවරුන් සඳහා වන රාජකීය විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකවරයෙකු ලෙස සේවය කළේය.

1965 පේරාදෙනි විශ්වවිද්‍යාලයට ඇතුල්වූ සමන් එහිදී දන්තවෛද්‍ය උපාධිය ඉහලින් සමත්වීය. පසුව ලන්ඩන් සහ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාල වලින් වැඩිදුර සමත්කම් ලැබීය. 1976 - 1990 දක්වා පේරාදෙනිය සරසවියේ (Oral Medicine) මුඛ වෛද්‍ය අංශයේ මහාචාර්යවරයා වශයෙන් හෙතෙම සේවය කළේ ය.

මහාචාර්ය වර්ණකුලසූරියගෙන් දන්ත වෛද්‍ය විද්‍යාවේ ප්‍රගතියට වූ සේවය සුළුපටු නොවේ. මුඛරෝග වැළදෙන හැටි හා ඒවා පිළිකා තත්වයට වර්ධනය වන සැටිත් එය කලින් වළක්වාගන්නේ කෙසේද යන්නත් ඔහු පර්යේෂණ මගින් ඔප්පුකර පෙන්වා දී ලංකාවද ලෝක සමාජය ද දැනුවත් කර ඇත. සැබැවින්ම එතුමා ශ්‍රීලංකාවට අඩම්බර විය හැකි මාහැඟි පුත්‍රැවනකි.




## How British honours are conferred

British honours are awarded on merit, for exceptional achievement or service.

Anybody can recommend a British national for an honour, which consist of life peerages, knighthoods, appointments to the Order of the British Empire and gallantry awards to servicemen and women and civilians.

The Queen chooses the recipients on the advice of the Prime Minister, to whom recommendations are sent either by government ministers or by members of the public. The honours are published in the official Crown newspaper, the London Gazette.

Private nominations, made by individuals or by organisations to the Prime Minister's Office, make up around a quarter of all recommendations.

Honorary awards for foreign nationals are recommended by the Secretary of State for Foreign and Commonwealth Affairs.

## 1 වන පිටුවෙන්
## හරි මග ඔස්සේ...........

එසේම බී.බී.සී. ඇතුළු මාධ්‍යයන්ද ප්‍රචාරට පටන්ගන්නවා ඇත. ද්‍රවිඩ සරණාගතයින්ගේ ඡන්දය මෙහෙයවන තක්කඩි කොටි ඡන්ද බ්‍රෝකර්ලාගෙන් යැපෙන කීත් වාස් ප්‍රමුඛ මේ රටේ මන්ත්‍රී කණ්ඩායම ද ක්‍රියාකාරී වනු ඇත. මේවා තුට්ටුවකටවත් ගණන් නොගෙන අප රටේ රජය කරගෙන යන වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යා යුතු ය. එවිට මුන්ට කළ හැකි කජ්ජක් නැත. කරන කජ්ජක්ද නැත. පසුගිය කාලයේ බුරුම රටේ සිදුවූ ගැටුම් අරහයා මේ ආණ්ඩුද, මාධ්‍යය ද කළ කෑගැසීම් අපට මතකය. හොඳ හෝ නරක වේවා බුරුමය, චීනය සමග තිබුණු කිට්ටු සබඳතාව නිසා එයට අතගැසීමට ඇමරිකා වද බියවිය. දැන් බකන් නිලාගෙන සිටිති. මේවායින් පාඩම් ඉගෙන අපද දැන් අරඹා ඇති හරිමග යා යුතුය. මෙතැනදී අප ජාතියේ ඉහළම පඬිරුව නක් වූ කුමාරතුංග මුනදාසයන් එකල ලියූ කවියක් මතක් වෙයි.

මහ හොඳට තිබේ නම්....
යන්ට දැසත් පෙනේ නම්....
කිම බැදිවල යන්නේ......
මං මුලාවූ එකෙක් සේ........

මේ සටන ජයගැන්ම සඳහා අප ජාතියට ශක්තිය ලැබේවායි පතමු!

